# දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වූ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය හා මැන්ඩෙලාගේ ප්‍රයාමය.

පී.ඒ.එල්. ඔෂානි*

**සංක්ෂේපය**

ලෝකය පුරා බොහෝ රටවල් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පීඩාවට ලක් කළ වර්ණභේදවාදී ප්‍රතිපත්තිමය ගැටලුව මෑත කාලයේ ක්‍රීඩා ලොව කැළඹූ දැවැන්ත ප්‍රශ්නයක් විය. කෙසේ වුවත් දකුණු අප්‍රිකානු රාජ්‍ය තුළ මහත් ආන්දෝලනයට ලක් වූ මෙම ප්‍රතිපත්තිය පසු කාලීනව දකුණු අප්‍රිකාව පුරා පිළිලයක් මෙන් පැතිරෙන්නට විය. කෙසේ නමුත් මෙකල දකුණු අප්‍රිකාවේ බලයට පත් වූ නෙල්සන් මැන්ඩෙලා නම් වූ කළු ජාතිකයා මෙම ප්‍රතිපත්තිය බිඳ හෙළීම සඳහා ක්‍රීඩාව අවියක් කර ගත්තේ ය. ඒ අනුව දකුණු අප්‍රිකානුවන් තුළ තිබූ ක්‍රීඩාව පිළිබඳ සහජ උන්මාදය තේරුම්ගත් මෙම නායකයා ක්‍රීඩා තරග සංවිධානයෙන් හා අන්තර් ජාතික ක්‍රීඩා සංගම් වල සාමාජිකත්වයන් නැවත ලබා ගනිමින් ද ක්‍රීඩාව හරහා සුදු හා කළු ජාතීන් අතර එකමුතුභාවයක් ගොඩනංවන ලදි. කෙසේ වුවත් ක්‍රීඩාව වූ යාත්‍රාව වර්ණභේදවාදය නම් වූ ගඟ තරණය කරලීම සඳහා යොදා ගන්නා ලදී.

**හැඳින්වීම**

1936 දී බර්ලින් නුවර පැවති ඔලිම්පික් උළෙලේ දී "ආර්යයන්ට පමණි" යනුවෙන් ඔලිම්පික් ගම්මානය පුරා ප්‍රසිද්ධ කර තිබූ පුවරු වර්ණභේදවාදී ආකල්ප පිළිබඳ මතකය අවදි කරයි. වර්ණභේදවාදී ප්‍රතිපත්තිය විවිධ රට වලට සුළු වශයෙන් හෝ බලපෑම් කළ කරුණක් බවට පත් වූ අතර විවිධ රටවල් මේ සඳහා දැක් වූ ප්‍රතිචාර විවිධාකාර විය. හිට්ලර්ගේ නායකත්වයෙන් යුතු ජර්මනියේ ඔලිම්පික් උළෙල පැවැත්වීමට යාමේ දී විවිධ අර්බුද ඇති වූ නමුදු මෙහිදී වර්ණභේදවාදී ප්‍රතිපත්තිය ප්‍රචලිත කරලීමේ මාධ්‍යයක් ලෙස ක්‍රීඩාව යොදා ගත් බවට ඉතිහාසය සාක්ෂි දරයි (මෙන්ඩිස්,1996). කෙසේ නමුදු වර්ණබේදවාදී ප්‍රතිපත්තයට එරෙහිව නැගී සිටි එකම නායකයා වූ නෙල්සන් මැන්ඩෙලා මෙම ප්‍රතිපත්තිය බිඳ දැමීම සඳහා ක්‍රීඩාව මාධ්‍යයක් කරගත් අයුරු පුදුම සහගතය. දකුණු අප්‍රිකාවේ ජනපති පදවියට පත් වීමත් සමඟ ඉන්දීය සංචාරයකට සහභාගී වූ මෙතුමා එම සංචාරයේ යෙදීමේ අරමුණු පැහැදිලි කිරීමේ දී එහි වර්ණභේදවාදී ප්‍රතිපත්තිය තුරන් කිරීමේ අරමුණ ද ගැබ් වී තිබුණු බව පැහැදිලි වේ (Mandela, 1994). මේ අනුව ක්‍රීඩාවට පෙළඹවීමේ බලයක් හා මිනිසුන් එකතු කිරීමේ, මිනිසුන්ට බලාපොරොත්තු ඇති කිරීමේ බලයක් ද, රටක් පාලනය කරන රජයකට වඩා ක්‍රීඩාව බලවත් වන බවද මැනවින් අවබෝධ කරගෙන සිටි මෙතුමා වර්ණභේදවාදී ප්‍රතිපත්තිය බිඳ දැමීම සඳහා ක්‍රීඩාව අවියක් කර ගත්තේ ය (Band, 2013).

* *තාවකාලික කථිකාචාර්ය, ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය, uksloshi@gmail.com*

ලෝකය පුරාම බෝහෝ රටවල විවිධ මුහුණුවරින් දේශපාලන කරලියට පිවිසි වර්ණභේදවාදය විවිධ නම් වලින් පෙනී සිටින ලදි. ඒ අනුව 1936 දී බර්ලින් ඔලිම්පික් උළෙලට පිවිසියේ නට්සිවාදී ප්‍රතිපත්තියක් ලෙස ය. මෙහිදී ද කළු සුදු ජාතීන් අතර වෙනස් සැලකුම් නිර්මාණය කළ අතර කළු ජාතීන් යුදෙව්වන් ලෙස නම් කරන ලදි. ඔවුනට ලබා දිය යුතු වරප්‍රසාද අහිමි කළ අතර මෙම උළෙලේදී එවකට ජර්මනියේ ජනපති වූ හිට්ලර් විසින් ඇමරිකාවෙන් ඉදිරිපත් කරනු ලැබූ යුදෙව් ජාතික ක්‍රීඩකයින් දෙදෙනා ඉවත් කරන ලෙස බලපෑම් කරන ලදි. තවද ඇමරිකන් ක්‍රීඩක ජෙසී ඕවන්ස්ගේ ජයග්‍රහණය පිළිගැනීමට හිට්ලර් අකමැති වීමත් පැසිස්ට්වාදී පුවත්පතක නීග්‍රෝජාතීන්ට මෙම ඔලිම්පික් උළෙලට සහභාගී වීමේ අයිතිය නැති බවත් ඔවුන් ඔලිම්පික් ව්‍යාපාරයෙන් පන්නා දැමිය යුතු බවත් සඳහන් කරන ලදි. (මෙන්ඩිස්,1996). මේ අනුව ලෝකයේ බොහෝ රටවල් වර්ණභේදවාදී ප්‍රතිපත්තිය තුළින් පීඩාවට පත් වූ ආකාරය පැහැදිලි වන අතර දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වූ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය පිළිබඳව විමසීමේදී;

දකුණු අප්‍රිකානු වර්ණභේදවාදී ගැටලුව මෑත කාලයේ ක්‍රීඩා ලොව කැළඹූ දැවැන්ත ප්‍රශ්නයක් විය. මෙහිදී ක්‍රීඩා කිරීමේ හා තරග වැදීමේ අයිතිය දකුණු අප්‍රිකාවේ සුදු ජාතීන්ට පමණක් සීමා කරගෙන සිටීම දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වූ වර්ණභේදවාදී ප්‍රතිපත්තියේ විශේෂ අංගයක් විය. (ගුණවර්ධන,1997)

දකුණු අප්‍රිකාවේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ හිටපු අමාත්‍යවරයෙකු වන ජෝන් උක්ලාක් මහතා වරක් ප්‍රකාශ කර සිටියේ "කළු සුදු මිශ්‍ර ක්‍රීඩා කණ්ඩායම් රට තුළ හෝ රටින් පිටත ක්‍රීඩා කිරීම රජයේ ප්‍රතිපත්තියක් නොවේ යැයි ද සුදු ක්‍රීඩකයින් පමණක් භුක්ති විඳින වරප්‍රසාද පැහැදිලිවම රටේ ප්‍රතිපත්තිය වී යැයි ද පැවසූ බව ලලිත් ගුණවර්ධන මහතාගේ (1997) ජගත් කෙළිබිමේ දේශපාලන කුණාටුව නම් කෘතියේ දක්වා තිබේ. මේ අනුව දකුණු අප්‍රිකාව මුල් කරගෙන ඇරඹූ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය නිසා ලෝකයේම පැවති ක්‍රීඩා උත්සව මෙම සංකල්පය මඟින් ඔත්පළ කරන ලදි. 1968 මෙක්සිකෝ ඔලිම්පික් උළෙල අවදානමට ලක් වීම, 1986 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට මින් දැඩි තර්ජන එල්ල විය. කෙසේ වුවත් මෙම ප්‍රතිපත්තිය හේතු කරගෙන දකුණු අප්‍රිකාවට ද ඔලිම්පික් උළෙල දෙකකුත්, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල දෙකකුත්, ජාත්‍යන්තර ක්‍රීඩා උළෙල හතරකුත් අහිමි විය. දකුණු අප්‍රිකාව ලෝකයෙන්ම කොන් වී තිබූ අවස්ථාවක මෙම තත්වය වටහා ගත් දකුණු අප්‍රිකාවේ හිටපු ජනපති නෙල්සන් මැන්ඩෙලා මෙම තත්වය වෙනස් කිරීම සඳහා ක්‍රීඩාව යාත්‍රාවක් කරගන්නා ලදි. (ගුණවර්ධන,1997)

**දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී ප්‍රතිපත්තියේ හැසිරීම.**

1948 දී දකුණු අප්‍රිකාවේ පැවති මහමැතිවරණයෙන් ජාතික පක්ෂය බලයට පත් විය. මෙම ජයග්‍රහණයත් සමඟ වර්ණභේදවාදය රාජ්‍ය ප්‍රතිපත්තිය බවට පත් විය. මෙම තත්වය පදනම් කරගෙන ක්‍රීඩා සංවිධාන වලට ද තම නියෝජිතයින් පත් කරමින් මුළු ක්‍රීඩා ක්ෂේත්‍රයේම ඒකාධිකාරී අයිතිය සුදු ජාතීන් සතු ව තබා ගන්නා ලදි. මෙයට විරුද්ධව දකුණු

අප්‍රිකානු කළු ජාතිකයන් එක්ව වර්ණබේදවාදී නොවන දකුණු අප්‍රිකානු ඔලිම්පික් කමිටුවක් 1963 දී පිහිටුවා ගන්නා ලදි. මෙම තත්වය මත 1963 නයිරෝබි සැසිවාරයට පෙර සිය වර්ණබේදවාදී ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙස අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවෙන් ජාතික ඔලිම්පික් කමිටුවට උපදෙස් දෙන ලදි. එවිට දකුණු අප්‍රිකානු රජය වර්ණභේදවාදය සිය අභ්‍යන්තර ප්‍රතිපත්තියක් මිස අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවට අයත් ප්‍රතිපත්තියක් නොවේ යැයි ද පවසන ලදි (ගුණවර්ධන,1997).

කෙසේ නමුදු අන්තර් ජාතික ඔලිම්පික් ප්‍රඥප්තියේ අංක 3 ට අනුව

"ආගම, වර්ණය, වර්ගය, දේශපාලනය, අනුව කිසියම් පුද්ගලයෙකුට වෙනස්කම් කිරීම විශේෂ සැලකිල්ලක් දැක්වීම තහනම් ය." යනුවෙන් සඳහන් කර තිබේ (Edwards, 2013).

කෙසේ නමුදු දකුණු අප්‍රිකානු රාජ්‍ය ප්‍රතිපත්තිය හා අන්තර් ජාතික ඔලිම්පික් ප්‍රඥප්තියත් එකිනෙක ගැටෙන මෙම අවස්ථාවේ දී 1964 ඔලිම්පික් උළෙලට සහභාගී වීමේ වරම දකුණු අප්‍රිකාවට අහිමි විය. තවද 1963-1966 කාල වල දී දකුණු අප්‍රිකාව ජගත් සම්මේලන වලින් නෙරපා දැමිය යුතු ය යනුවෙන් ගෙන ආ යෝජනා පා පන්දු සම්මේලනය හැර අනෙක් සම්මේලන ප්‍රතික්ෂේප නොකළේ ය. ඊට හේතුව වූයේ මෙම සම්මේලන වල වැඩි පිරිසක් සුදු ජාතිකයින් වීම ය (ගුණවර්ධන,1997).

අප්‍රිකානු ජාතීන් එක්ව අප්‍රිකානු ක්‍රීඩා කවුන්සිලයක් පිහිටුවා ගෙන තිබූ අතර මෙම කවුන්සිලය පිහිටුවීමේ මුඛ්‍ය අර්ථය වූයේ දකුණු අප්‍රිකානු ක්‍රීඩා ප්‍රතිපත්තියට පහර ගැසීම ය. 1966 වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානය ද වර්ණභේදවාදය හෙලා දකිමින් එම රට සමඟ සබඳතා නැවැත් වූ අතර ජාත්‍යන්තර බලපෑම් වර්ණබේදවාදයට එරෙහිව කැටි ගැසෙන කල දකුණු අප්‍රිකාව 1968 දී ඔලිම්පික් සඳහා මිශ්‍ර ක්‍රීඩා කණ්ඩායම් යවන බවට පොරොන්දු විය. නමුත් මෙහිදී දකුණු අප්‍රිකාවේ අගමැති වෝර්ස්ටර් ඔලිම්පික් උළෙලට මිශ්‍ර කණ්ඩායමක් යැව්වත් රජයේ වර්ණභේදවාදී ප්‍රතිපත්ති වෙනස් නොවන බව ස්ථිර ලෙස ප්‍රකාශ කළේ ය. මෙම තත්වය මත ලෝකයේ බොහෝ රටවල් වල සහභාගිත්වයෙන් ඡන්ද විමසීමක් සිදු වූ අතර මෙහිදී ඡන්ද 47ක් දකුණු අප්‍රිකාව නෙරපීමට පක්ෂවත්, විපක්ෂවත් ඡන්ද දුන් අතර 8 දෙනෙක් ඡන්දය දීමේන් වැලකී සිටිය හ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1968 ඔලිම්පික් උළෙලට සහභාගී වීමේ වරම දකුණු අප්‍රිකාවට අහිමි විය (ගුණවර්ධන,1997).

මෙම අහිමි වීම පදනම් කරගෙන 1968 ඔලිම්පික් උළෙලින් පසු දකුණු අප්‍රිකාව ඔලිම්පික් ලාංඡනය භාවිත කරමින් සුදු ජාතිකයින්ට පමණක් සීමා වූ ක්‍රීඩා උළෙලක් සංවිධානය කරන්නට උත්සාහ ගත්තේ ය. මෙවිට ලෝඩ් කිලානින් දකුණු අප්‍රිකානු ජාතික ඔලිම්පික් කමිටුව සඳහටම ඔලිම්පික් ක්ෂේත්‍රයෙන් විසිවීමට ඉඩ ඇති බව පැවසී ය. එම කරුණ යථාර්ථයක් බවට පත් කරමින් 1970 දී ඇම්ස්ටර්ඩෑම්හි පැවති අන්තර් ජාතික ඔලිම්පික් කමිටු විධායක රැස්වීමේදී වර්ණභේදවාදී ප්‍රතිපත්තිය හා ඔලිම්පික් ලාංඡනය නීති

විරෝධීව භාවිතයට ගැනීම උඩ පැවති ජන්ද විමසීමකින් දකුණු අප්‍රිකාව අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවෙන් නෙරපා දැමීමට තීරණය විය (ගුණවර්ධන,1997).

අප්‍රිකානු මහද්වීපයේ පහත කොටසේ වෙරළාසන්නයේ පිහිටි රාජ්‍යයක් වූ දකුණු අප්‍රිකාව මෙසේ ලොව ක්‍රීඩා ක්ෂේත්‍රයට බලපෑම් කළේ වරක් දෙවරක් නොවේ. කලින් ටෙස්ට් වරම් ලබා සිටි රටක් වශයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ දස්කම් දැක්වූ දකුණු අප්‍රිකාව වර්ණභේදවාදය අතින් අනුගමනය කරන ලද දැඩි ප්‍රතිපත්තිය නිසාම ටෙස්ට් වරම්ද ඔවුනට අහිමි වු අතර එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව කිසිම රටකට ඔවුන් සමඟ ක්‍රීඩා සබඳතා පැවැත් වීම තහනම් වූ අතර අනෙකුත් රජ්‍ය සබඳතා පැවැත් වීම තහනම් නොවීය (ගුණවර්ධන,1997).

මෙම සිදුවීම් මත දකුණු අප්‍රිකාව ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ලෝකයෙන් කොන් වී සිටි සමයක මොවුන්ගේ ප්‍රතිපත්තිය වූයේ ලෝකයේ අනෙකුත් ක්‍රීඩා කණ්ඩායම් හා ක්‍රීඩකයින් තම රටට ගෙන්වා ක්‍රීඩා තරග පැවැත්වීම ය. මේ වෙනුවෙන් ඔවුන් උපයෝගී කර ගන්නේ ක්‍රීඩකයින් වෙනුවෙන් පිරිනමන විශාල මුදල් ප්‍රමාණයකි. මුදල් වලට වහල් වූ ඇතැම් රටවල් වල ක්‍රීඩකයෝ මෙම තහනම නොතකා දකුණු අප්‍රිකාවේ ක්‍රීඩා කිරීමට ගිය හ. එංගලන්තයේ ග්‍රෙහැම් ගුච්, ජෙප් බොයිකොට් හා ජෝන් එම්බියුරිස් යන ක්‍රීඩකයින්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩකයින් රැසක් 1982 වර්ෂයේ දකුණු අප්‍රිකාවේ සංචාරයකට ගියහ. කිම් හියුස්ගේ සහභාගිත්වයෙන් තවත් එංගලන්ත පිලක් දකුණු අප්‍රිකාවේ සංචාරයකට ගිය හ. මෙයට බ්‍රිතාන්‍ය ක්‍රීඩා ඇමති නීල් මැක්පාfලේන් මහතා බලවත් විරෝධය පළ කළේය. මේ පිළිබඳ බ්‍රිතාන්‍ය අගමැතිනිය මාග්‍රට් තැචර් මහත්මිය මෙම ක්‍රීඩකයින්ගේ පෞද්ගලික සංචාර ගැන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කළා ය. බ්‍රිතාන්‍ය වැසියෙකුට ලෝකයේ ඕනෑම රටක සංචාරය කිරීමට අයිතියක් ඇති බව පවසන ඇය මෙම සංචාරය නැවැත්වීමට ද ඇයට කිසිදු අයිතියක් නැති බව ප්‍රකාශ කළා ය. අගමැතිනියගේ මෙම ප්‍රකාශට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කම්කරු හා ලිබරල් පාක්ෂික නියෝජිතයින් දැඩි විරුද්ධත්වයක් දක්වා ඇත. මෙම කණ්ඩායමේ නායක ග්‍රෙහැම් ගුච් "මෙම සංචාරය අපගේ පෞද්ගලික උවමනාවන් සඳහා වන්නක් , අපගේ රැකියාව ක්‍රිකට් ක්‍රීඩාව, අප ජීවත් වන්නේ එයින් , මේ ගැන අපට කිසිම ප්‍රශ්නයක් නැහැ." යනුවෙන් පැවසී ය (Busbee, 2013).

වර්ණභේදවාදී දකුණු අප්‍රිකාව ක්‍රීඩා තරගවලට පමණක් නොව අනෙකුත් රාජ්‍ය සංදර්භය තුළද මෙම වර්ණබේදවාදී ප්‍රතිපත්තියේ විෂබීජ ව්‍යාප්ත කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය පවා මේ රටට එරෙහිව නීති පැනවූවත් දකුණු අප්‍රිකාව සිය වර්ණභේදවාදී ප්‍රතිපත්තය ඉවත නොදැමී ය. මෙම ප්‍රතිපත්තිය නව මං සොයමින් රොඩේසියාව වැනි රටවල ද ව්‍යාප්ත වෙමින් එම රටවල් ද මෙම වර්ණභේදවාදී විෂබීජවලින් ඔත්පල කරන ලදී (ගුණවර්ධන,1997).

**නෙල්සන් මැන්ඩෙලාගේ ප්‍රයාමය.**

ලෝකය පුරාම පිළිලයක් බවට පත්ව තිබූ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය දකුණු අප්‍රිකාවට ගැටලු සහගත තත්වයන් ඇති කරලීය. එබැවින් මෙම තත්වයෙන් තම රට තම ජාතිය මුදවා

ගැනීම සඳහා නෙල්සන් මැන්ඩෙලා මහත් ප්‍රයත්න දැරීය. වරක් නෙල්සන් මැන්ඩෙලා පවසා සිටියේ ඔහුට ක්‍රීඩාව පිළිබඳව හා එහි නීති රීති සම්බන්ධයෙන් මනා දැනුමක් නොමැති වුවත් ක්‍රීඩාව තුළින් දේශපාලනයට බලපෑමක් කළ හැකි බව අවබෝධ කර ගත් බවය. තවත් විටෙක "ක්‍රීඩාවට ලෝකය වෙනස් කිරීමට බලයක් ඇත" යනුවෙන් පැවසූ නෙල්සන් මැන්ඩෙලා 1991 දී දකුණු අප්‍රිකාවේ ජනපති පදවියට පත් ව දකුණු අප්‍රිකාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ක්‍රීඩාව පිළිබඳ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය නිසා ලෝකයෙන් හුදකලා වී තිබූ එම රට ගොඩ ගැනීමට ක්‍රීඩාව යොදා ගන්නා ලදි. දකුණු අප්‍රිකානුවන් ක්‍රීඩාව පිළිබඳ සහජ උන්මාදයකින් පෙළෙන බව තේරුම් ගත් ඔහු පළමුවෙන්ම කරනු ලැබුවේ ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධාන වල සාමාජිකත්වයෙන් නෙරපා තිබූ දකුණු අප්‍රිකාවට එම සාමාජිකත්වයන් ලබා ගැනීමට කටයුතු කරලීම යි.

මේ අනුව 1991 දී International Cricket Council හි සාමාජිකත්වය ලබා ගැනීමට ලංකාවේ එවකට සිටි ජනපති ආර්.ප්‍රේමදාස මහතාට දුරකථනයෙන් ඇමතුමක් ලබා දී එවකට මෙරට විදේශ ඇමතිව සිටි ටිරෝන් ප්‍රනාන්දු (ලංකාවේ ක්‍රිකට් සංගමයේ සභාපති) මහතාට දුරකථනයෙන් අමතා එහි සාමාජිකත්වය ලබා ගත්තේ ය. ඉක්බිති 1991 දී ඉන්දියාව සමඟ එක්දින ක්‍රිකට් තරඟයක් පවත්වන ලදි. තවද 1992 දී ලෝක කුසලාන ක්‍රිකට් තරගයකට බටහිර ඉන්දියානුවන්, දකුණු අප්‍රිකානුවන් සමඟ තරඟවදින ලදි. 1992 දී බ්‍රිතාන්‍ය අගමැති මාග්‍රට් තැචර් ගේ මැදිහත් වීම මත ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ සාමාජිකත්වය ලබා දෙන ලදි. ඉන්පසු 1992 දී ප්‍රථමයෙන්ම දකුණු අප්‍රිකානු කණ්ඩායමක් ඔලිම්පික් තරගවලට සහභාගී වන ලදි. එනම් බාසිලෝනි හි පැවති ඔලිම්පික් උලෙළට ය. කෙසේ වෙතත් දකුණු අප්‍රිකාව ලෝකයෙන් හුදකලා වූ අවදියක මැන්ඩෙලාගේ නායකත්වය එම තත්වයෙන් මුදවා ගැනීමට හේතුකාරක වන ලදි (Bairner, 1995).

මේ ආකාරයෙන් මළල ක්‍රීඩා, පා පන්දු, පැසි පන්දු බොක්සිං ආදී සියලුම සංගම් වල සාමාජිකත්වය ලබා ගත්තේ ය. 1991 දී ලෝක පා පන්දු ශූරතාවලියේ දී පුරෝ තරග (Pre-Games) කිහිපයක් සංවිධානය කිරීමට ද භාරගත්තේ ය. මේ ආකාරයෙන් දකුණු අප්‍රිකාව ක්‍රීඩා ක්ෂේත්‍රයේ දිගින් දිගටම ඉදිරියට ගියේ එතෙක් තිබූ ක්‍රීඩා වර්ණභේදවාදී ප්‍රතිපත්තියේ කළු පැල්ලම මකා දමමිනි. මැන්ඩෙලාගේ සමය තුළ තවද මෙරට වර්ණභේදවාදී ප්‍රතිපත්තිය වළක්වාලීම උදෙසා ක්‍රීඩාව තුළින් RDP නම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේ ය. එහි අඩංගු කරුණු ලෙස

- සියලුම ක්‍රීඩා හා විශ්‍රාන්ති සංවිධාන දකුණු අප්‍රිකානුවන්ගේ අවශ්‍යතාවයන් සිතා බැලිය යුතුය.
- ක්‍රීඩාව තුළින් වාමාංශිකයෙකු නැවත නිර්මාණය නොකළ යුතුය.
- ක්‍රීඩාව හා විශ්‍රාන්තිය තුළින් නිදහස්කාමි ස්වාධීන සමාජයක් බලගැන්විය යුතු ය යන්නත් ය (Bairner, 1995).

තවද මැන්ඩෙලාගේ නායකත්වය යටතේ 1995 දී ලෝක රගර් ශූරතාවලිය සංවිධානය කිරීමට භාරගෙන එය ජයග්‍රහණය කිරීම සඳහා මුළුමනින්ම සුදු ජාතිකයින්ගෙන් සමන්විත දකුණු අප්‍රිකානු කණ්ඩායමක් ඉදිරිපත් කර ඔවුනට සියලු ධෛර්යය ලබා දුන්නේ ය. මෙම තරගය ජය ගත්තේ ද දකුණු අප්‍රිකානු කණ්ඩායම වන අතර මෙහි දී ක්‍රීඩකයින්ට සුභ පැතීම සඳහා පිටියට පැමිණි මැන්ඩෙලා දකුණු අප්‍රිකානු කණ්ඩායමේ ක්‍රීඩකයින් පැළඳ සිටි ආකාරයේ ජර්සියක් පැළඳ සිටියේ ය. මෙම දර්ශනය දුටු නරඹන්නන් සියල්ලෝම පළමුව නිශ්ශබ්ද වී පසුව නෙල්සන් නෙල්සන් යනුවෙන් ප්‍රතිරාව නැංවූයේ ය. මෙය ලොව මවිත කරන දර්ශනයක් බවට පත් විය. මෙම තරගයේ ජයග්‍රහණය ද දකුණු අප්‍රිකානු කණ්ඩායමේ ක්‍රීඩකයින් හිමි කර ගැනීමත් මෙම තරග ජයග්‍රහණයේ දී කුසලාන ප්‍රදානය සිදු කරනු ලැබුවේ ද මැන්ඩෙලා විසින් වීමත් වර්ණභේදවාදී ප්‍රතිපත්තිය බිඳ දැමීමේ පළමු පියවර විය (Edwards, 2013).

මේ ආකාරයට වර්ණභේදවාදී ප්‍රතිපත්තිය හේතු කරගෙන අඳුරු අගාධයක ගිලෙමින් තිබූ දකුණු අප්‍රිකාවට පහන් තරුවක් සේ පැයූ මැන්ඩෙලාගේ නායකත්වය අද්විතීය එළියක් ඇති කළේ ය. එනම් වසර පහක කාලයක් තුළ ක්‍රීඩාව ආශ්‍රිතව තිබූ වර්ණභේදවාදය පිළිබඳව පැවති දැවැන්ත ප්‍රශ්නය විසඳා දකුණු අප්‍රිකාව ලෝකයේ පළමු පෙළේ රටක් බවට පත් කළේ ය. අදත් දකුණු අප්‍රිකාව ක්‍රිකට්, පාපන්දු හා රගර් යන ක්‍රීඩා වලින් ඉහළ තත්වයක වැජඹෙනු දැකිය හැකිය.

**නිගමනය**

"නහි වේරේන වේරානී" යන බුදු වදන සිහිපත් කරලමින් නෙල්සන් මැන්ඩෙලා දකුණු අප්‍රිකාවේ වර්ණබේදවාදී ප්‍රතිපත්තිය මුලිනුපුටා දැමීමට අසිපත නොව ක්‍රීඩාව යොදා ගන්නා ලදි. මේ අනුව 1948 දී දකුණු අප්‍රිකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය බවට පත්ව තිබූ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය ක්‍රීඩා ක්ෂේත්‍රය උපයෝගී කර ගනිමින් එරටින් පන්නා දැමීමට ඔහුට හැකි විය. කෙසේ නමුදු ක්‍රීඩාව වූ කලී ලෝකය පුරා සන්නිවේදනයේ යෙදිය හැකි සන්නිවේදන මාධ්‍යයක් වන බැවින් මැන්ඩෙලා ලෝකයට වර්ණභේදවාදයේ අඳුරු සෙවණැලි මකා දැමිය යුතුය යන පණිවුඩ යැවීම සඳහා ක්‍රීඩාව සම්ප්‍රේෂණ මාධ්‍යයක් කර ගත් අයුරු ඉහත විග්‍රය හරහා මොනවට පැහැදිලි වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගුණවර්ධන, එල්. (1997), *ජගත් කෙළිබිමේ දේශපාලන කුණාටුව*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මෙන්ඩිස්, සී. (1996), *ඔලිම්පික් ක්‍රීඩා සියවසක කථාව*, ලස්සන මුද්‍රණ ශිල්පියෝ, නුගේගොඩ.

Bairner, A. (1995), *Sport And Politics*. 3rd ed., USCC publisher, California.

Band, D. (2013), *BBC Sport.* [Online]
Available at: www.bbc.com

Busbee, J. (2013), *Yahoo Sports.* [Online]
Available at: www.sports.yahoo.com

Edwards, P. (2013), *CNN.* [Online]
Available at: www.edition.cnn.com

Mandela, N. (1994), *Long Work to Freedom, The Autobiography of Nelson Manedela,* Time Warner Book Group, London.